සති පාසල

7 ශ්‍රේණිය | විද්‍යාව | සැප්තැම්බර් 1වන සතිය

15 - පස

01. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්

- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) පිටු අංක 65 හි දැක්වෙන ක්‍රියාකාරකම 15.5 ද පිටු අංක 67 හි දැක්වෙන ක්‍රියාකාරකම 15.7 හා 15.8 ද සිදු කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) පිටු අංක 66 හි දැක්වෙන ක්‍රියාකාරකම 15.6 කෙරෙහි අවධානය යොමු කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) 65 - 69 පිටු අංක යටතේ ඇති පාඩම හොඳින් අධ්‍යයනය කරමින් පාංශු වාතය හා එහි කාර්ය, පාංශු ජලය හා එහි කාර්ය, පාංශු ජීවීන් හා එහි කාර්ය පිළිබඳවත් පාංශු පැතිකඩ පිළිබඳවත් අධ්‍යයනය කරන්න.
- ඔබ උගත් කරුණු ඇසුරෙන් කෙටි සටහනක් සකස් කරන්න.

02. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී ගර ගත හැකි ආධාරක

- 7 ශ්‍රේණිය විද්‍යාව දෙවන පෙළ පොත (පිටු අංක 65 සිට 69)
- E - නැණ පියස වෙබ් අඩවිය
  https://www.enenapiyasa.lk/lms/course/view.php?id=21#section-15
- E - තක්සලාව වෙබ් අඩවිය
  https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=986&section=15
- ගුරු ගෙදර නාලිකාව
  https://www.youtube.com/watch?v=Wwo2e52D_8o&t=26s

03. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල

- පසේ සංයුතිය දැක්වීම.
- පසේ සංඝටක සහ ඒවායේ ක්‍රියාකාරිත්වය විස්තර කිරීම.

04. ඇගයීම

01) පසක් ඇඟිලි තුඩු වලින් පරීක්ෂා කිරීමෙන් හඳුනාගත හැකි ගති ලක්ෂණය වන්නේ, පසේ,
   1) ව්‍යුහය   2) වයනය   3) සංයුතිය   4) ජලය

02) වගා කටයුතු සඳහා ඉතා සුදුසු පස වන්නේ,
   1) මැටි පස   2) වැලි පස   3) බොරලු පස   4) ලෝම පස

03) සිනිඳු වයනයකින් යුක්ත, තරමින් මධ්‍යස්ථ අංශු වන්නේ,
   1) රොන් මඩ   2) මැටි   3) වැලි   4) හියුමස්

04) පාංශු කාබනික ද්‍රව්‍ය වල කාර්යයක් නොවන්නේ,
   1) පස තුල ජලය රඳවා ගැනීම.
   2) පස තුල වාතය රඳවා ගැනීම.
   3) වියළි කාලයේදී පස ඉරිතැලීම වැළැක්වීම.
   4) පස තුළ උෂ්ණත්වය පාලනය කිරීම.